# ඛන්ධ ආයතන ධාතු විග්‍රහය තුළින් ප්‍රකට වන බෞද්ධ අනාත්මතා සිද්ධාන්තය පිළිබඳ විමසීමක්

රිදීගම වනරතන හිමි

## හැඳින්වීම

බුදු දහමේ මූලික අරමුණ වන විමුක්තිය සඳහා ලෝකය හා සත්වයා පිළිබඳ ව ඇත්ත ඇති සැටියෙන් අවබෝධ කොට ගත යුතු ය. යථාභූත ඤාණ දර්ශනය වශයෙන් පෙළ දහමෙහි විස්තර වන්නේ එයයි.[1]

පුද්ගලයාගේ ඇස, කන ආදී ඉඳුරන් මඟින් මෙන් ම ලෞකික ඉන්ද්‍රිය ඥාණය ඉක්මවා ගිය උසස් ඥාණ ශක්තීන් මගින් ද මෙම අවබෝධය ලද හැකි ය. සත්වයා පිළිබඳ ඇත්ත ඇති සැටියෙන් අවබෝධ කිරීමේ දී ඛන්ධ ආයතන ධාතු විග්‍රහය ඉතා වැදගත් වේ. එහිදී ආත්ම වශයෙන් ගැනෙන, වෙනස් නොවන සුලු යම් දෙයක් මිනිසා තුළ ඇතැයි යන ආත්මවාදී දෘෂ්ඨියේ ඇති සාවද්‍ය භාවය පිළිබඳ පුළුල් ලෙස පැහැදිලි කරනු ලැබේ. මෙහිදී ආත්මවාදී දර්ශනය පිළිගත්ත පිරිස් එයම සත්‍යය යැයි අනෙක්වා අසත්‍යය යැය[2] කිසියම් ලෙසකට දෘෂ්ඨිගත වූ අයුරු සූත්‍ර ධර්ම පිරික්සීමේ දී පැහැදිලි වේ. මුල් බුදුසමයට අනුව දෘෂ්ටි බොහෝ යැයි කිව යුතු අතර ඒ සියල්ලම ප්‍රධාන වශයෙන් කණ්ඩායම් දෙකකට අයත් වේ. එනම්, භව දිට්ඨියට හා විභව දිට්ඨියට ය. මේ දෙකට ඇතුළත් දෘෂ්ටිවාද 62 ක් පමණ බ්‍රහ්මජාල සූත්‍රයෙහි විස්තර වී ඇත. මේ අතර බුද්ධකාලීන විවිධ චින්තකයන්ගේ මුවග රැව් දුන් ප්‍රධාන දෘෂ්ටියක් වූයේ ආත්ම දෘෂ්ටිය යි. මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයේ දෘෂ්ටිස්ථාන 06

ක් නම් වී තිබේ. මගේ ආත්මය ඇත, මගේ ආත්මය නැත, මම ම ආත්මය හැඳිනගතිමි, මම ම අනාත්මය හැඳිනගතිමි, අනාත්ම වූ මම ම ආත්මය හැඳිනගතිමි, ආත්මය නිත්‍ය තහවුරු කරගත්තකි, සදාකාලිකය නොපෙරලෙන ස්වභාවය ඇත්තේ ය යනුවෙනි. මෙහි ආත්මය හෝ අනාත්මය යන්න කුමක් ද පැනනැගෙන දාර්ශනික ප්‍රස්තුතයට පිළිතුරක් සෙවීමේ දී ඛන්ධ, ආයතන, ධාතු විභාගය වැදගත් වේ. එය ආත්මවාදය පිළිබඳ බෞද්ධ ස්ථාවරය අවබෝධ කරගැනීමට ඉවහල් වේ.

## විමසීම

භාරතීය බොහෝ ආගම් මගින් වෙනස් නොවන සුලු යමක් මිනිසා තුළ ඇති බව ඉගැන්වූ අතර එය ආත්ම නමින් හැඳින්විණි. ඇතැම් භාරතීය ආගම්වලට අනුව ඊශ්වරයා විසින් මවන ලද ආත්මයක් පුද්ගලයාගේ මරණෙන් පසු එය මැවුම්කර දෙවියන්ගේ කැමැත්ත අනුව ස්වර්ගයෙහි හෝ නිරයෙහි නිත්‍ය වාසය ලබයි. මෙයින් පැහැදිලිවන්නේ පුද්ගලයන් සතුව පවත්නා කිසි කලෙක කිසි අයුරකින් වෙනස් නොවන විනාශයට පත් නොවන පරමාර්ථමය ආත්මයක් ඇති බවයි. භෞතික හා අධි භෞතික සෑම ස්වභාවයක්ම මෙම ආත්ම දෘෂ්ටිය මත පිහිටා විග්‍රහ කිරීමට ඇතැම් ආගමික චින්තකවරුන් ඉදිරිපත්වන අයුරු භාරතීය ඉතිහාසය විමසීමෙන් පැහැදිලි ය. එහිදී ලෝකය යනු කුමක් ද? ඒ තුල පුද්ගලයා යනු කවරෙක් ද? මෙවැනි ප්‍රශ්නවලදී ඒවායෙහි සැකැස්ම හා පැවැත්ම නිර්මාණවාදී ලෙස තේරුම් කිරීමට දේවවාදී ආගම් පෙළඹී තිබේ. ඇතැමෙක් අහේතුකව හටගත් ආත්මයක් ඉදිරිපත් කරති. ඇතැමෙක් උච්ඡේදයට පත්වන ආත්මයක් ගැන කියති. සමස්ථයක් වශයෙන් මේ සියලු ම මතයන්හිදී ආත්ම සංකල්පනයක ක්‍රියාකාරීත්වය දක්නට ලැබේ.

බුදුදහම නිත්‍ය සදාකාලික වූ ආත්මයක් නොපිළිගනී. ආත්ම සංකල්පය මනඃකල්පිත මිත්‍යා විශ්වාසයක් බව බෞද්ධ ඉගැන්වීමයි. මම ය, මාගේ ය යන අහිතකර හැඟීම් ද තෘෂ්ණාව, මානය, රාගය, ද්වේෂය වැනි සියලු ක්ලේශයන් ද උපදින්නේ

16 OCT 2017



මේ ආත්ම දෘෂ්ටිය නිසාවෙන් බුදුසමය එවැනි ආත්ම දෘෂ්ටියක් නොපිළිගනී. සියලු ම සංස්කාර ධර්මයන් ම අනාත්ම වශයෙන් බුදුදහම පැහැදිලි කරයි. ඛන්ධ, ආයතන, ධාතු විග්‍රහයෙන් ද ප්‍රකට වන්නේ ආත්මවාදය බැහැර කොට අනාත්මවාදය තහවුරු කිරීමයි. සත්වයා පුද්ගලයා යනු ස්කන්ධ ආයතනවල එකතුවක් සමවායක් යයි පෙන්වාදෙන බුදුසමය එම පදාර්ථයන්හි වෙනස් නොවන නිත්‍ය ආත්මයක පැවැත්මක් නොමැති බව ප්‍රකට කරයි. බුදුන් වහන්සේ ඇතැම් තැනකදී අනිත්‍යතාව ඇසුරෙන් අනාත්ම ලක්ෂණය ප්‍රකට කරති. ඇතැම් තැනක දුක්ඛතාව ඇසුරෙන් අනාත්ම ලක්ෂණය ප්‍රකට කරති. තවත් සමහර තැනෙක අනිත්‍ය, දුක්ඛ යන දෙකින්ම අනාත්ම බව ප්‍රකට කරති. මජ්ඣිම නිකායේ එන ඡඡක්ක සූත්‍රයේ දී අනිත්‍ය පදනම් කරගනිමින් ආත්මවාදය ඛණ්ඩනය කොට ඇත.

"යම් කෙනෙකු ඇස ආත්මය යි කියන්නේ නම් එය වැරදි ය. මක් නිසා ද, ඇසෙහි උපත හා විපත (උප්පාද වය) දක්නට ලැබෙන බැවිනි. මෙසේ ඇසත්, රූපයත්, චක්ඛු විඥාණයත්, චක්ඛු සම්ඵස්සයත් ඒ නිසා ඇතිවන හැඟීම් සියල්ලත් ඒ හා සම්බන්ධ වන තණ්හාවත් යන සියල්ලෙහි ම හටගැනීම හා විනාශය දක්නට ලැබෙන බැවින් ඒ කිසිවක් ආත්ම වශයෙන් ගත නොහැකි බවත්, මම ය, මාගේ වශයෙන් ගත නොහැකි බවත් බුදුරජාණන් වහන්සේ එහිදී දේශනා කොට ඇත.[3] අනත්ත සූත්‍රයෙන් ද මෙම අදහස පැහැදිලි වේ.

"මහණෙනි, මේ රූපය ආත්ම වන්නේ නම් මේ රූපය ආබාධ පිණිස නොපවත්නේ ය. මගේ රූපය මෙසේ වේවා, මගේ රූපය මෙසේ නොවේවායි රූපය පිළිබඳව කරන ප්‍රාර්ථනාව සාර්ථක වන්නේ ය. මහණෙනි, යම් හෙයකින් මේ රූපය අනාත්ම වේ ද? එහෙයින් රූපය ආබාධ පිණිස පවතී. මගේ රූපය මෙසේ නොවේවා යන පැතුම ද සාර්ථක නොවේ.[4]

සංයුක්ත නිකායේ අරහත්ත සූත්‍රය හා මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයේ දී අනාත්ම ලක්ෂණය පෙන්වා දී ඇත්තේ අනිත්‍ය හා දුක්ඛ යන ලක්ෂණ දෙක ඇසුරෙන් ය.

''රූපාදී පංචස්කන්ධය (නේතං මම) මාගේ නොවේ ය, (නේ සෝ හමස්මි) එය මම නොවෙමි ය, (න මේ සෝ අත්තා) එය මගේ ආත්මය නොවේ යයි මෙසේ මෙනෙහි කරන තැනැත්තාගේ සිත රූපාදී ස්කන්ධයන් කෙරෙහි කලකිරෙයි. කලකිරුණේ නො ඇලෙයි. නොඇලීමෙන් එය අත්හැරදමා එයින් මිදෙයි. මිදුණු කල්හි එයින් මිදුණේ ය යන ඥානය වෙයි.[5]

පටිච්චසමුප්පාද දේශනාව ඇසුරෙන් ද බුදුසමය ආත්මවාදය බැහැර කොට අනාත්මවාදය තහවුරු කරයි. ලෝකය හේතු-ඵල ධර්මතාවෙන් යුක්ත බවත් අන්‍යෝන්‍ය සම්බන්ධය ඇති ව සාපේක්ෂව සකලවිය පදාර්ථයන්ගේ පැවැත්ම සිදුවන බැවින් නිත්‍ය ආත්මයක පැවැත්මක් පිළිගත නොහැකි බවත් පටිච්ච සමුප්පාද න්‍යාය තුළින් අනාවරණය කරයි.[6] සංයුක්ත නිකායේ සළායතන සංයුක්තයට අයත් සූත්‍රයක දැක්වෙන අන්දමට ලෝකය ශූන්‍ය යයි වේ. එසේ පවසන්නේ ආත්මය හා ආත්මයට අයිති යයි ගත හැකි යමක් නැති නිසා යයි ද සඳහන් වෙයි. එසේ ආත්මය හා ආත්මය පිළිබඳ දෙයකින් ශූන්‍ය වූයේ කුමක් ද? ආධ්‍යාත්මික (ඉන්ද්‍රිය) හා බාහිර (අරමුණු) ආයතන පද්ධතිය යි. එමගින් ස්කන්ධ, ධාතු, ආයතන වශයෙන් සංග්‍රහ කෙරෙන සමස්ත ලෝකයම ශූන්‍ය බවත්, එබැවින් එය ආත්මය ලෙස ගැනිය නොහැකි බවත් බුදුසමය අවධාරණය කරයි. බෞද්ධ ඉගැන්වීමට අනුව පෙනීයන්නේ සත්වයා, පුද්ගලයා, මම ආදී වශයෙන් කෙරෙන ව්‍යවහාර පරමාර්ථ වශයෙන් ගත් කළ පිළිගත නොහැකි බවයි. ඇත්තේ ස්කන්ධ, ධාතු, ආයතනයන්ගේ එකතුවක් පමණක් බවයි. වෙනත් අයුරකින් පැහැදිලි කළහොත් බුදුදහමේ ස්කන්ධ, ධාතු, ආයතන විග්‍රහයෙන් අපේක්ෂා කරන්නේ ද ආත්ම යැයි ගැනෙන සදාකාලිකව පවතින යමක් සත්වයා තුළ පවතී ය යන සාවද්‍ය දෘෂ්ටිය බැහැර කිරීම ය.

ස්කන්ධ පංචකය, ආයතන දොළොස හා දහ අට ධාතු යන මේවා සියල්ල ම අනිත්‍ය නොහොත් වෙනස්වන ස්වභාවය නිසා ඒවා දුකට හේතු වන බව විවිධ සූත්‍ර දේශනාවලින් පැහැදිලි ය. සංයුක්ත නිකායේ එන වජිරා සූත්‍රයේ දී රථයක් උපමාවට ගනිමින් ඉහත අදහස පැහැදිලි කරයි. සම්මුතිමය වශයෙන් රථය



යන්න යෙදුව ද එහි ඇති කොටස් වෙන් කළ පසු එහි රථය යැයි දෙයක් නොමැත. සත්ත්වයා ද ස්කන්ධ, ආයතන හා ධාතු වශයෙන් වෙන් කළ විට එහි සත්වයා, පුද්ගලයා යැයි කිසිවකුත් නොමැති බව යි.[7] එබැවින් ආත්ම යැයි ස්ථිර වූ පදාර්ථයක් පිළිබඳ ඇති විශ්වාසය සාවද්‍ය බව පැහැදිලි ය.

ඛන්ධ යන්නෙහි ගොඩ, රාශිය යන අරුත් ඇත. පුද්ගලයා, සත්වයා යන්න ගොඩවල් පහක සමවායක් බව බුදුසමය පෙන්වා දේ.

1. රූපක්ඛන්ධ
2. වේදනාක්ඛන්ධ
3. සඤ්ඤාක්ඛන්ධ
4. සංඛාරාක්ඛන්ධ
5. විඤ්ඤාණක්ඛන්ධ

යනු එම ස්කන්ධයන් ය. මෙම සියලුම ස්කන්ධයන්හි ඇති යථා ස්වභාවය නම් ඒවා අනිත්‍යතාව මූලික කොට ඇති බවයි. විසුද්ධිමාර්ගයේ දී ශීත, උෂ්ණාදී විරුද්ධ ප්‍රත්‍යය නිසා විපරීත භාවයට පැමිණෙන යම් පමණ ධර්ම සමූහයක් වේ නම් ඒ සියල්ල එක්කොට රූපක්ඛන්ධය යි දත යුතු යැයි විස්තර කෙරේ.[8]

රූපක්ඛන්ධයට අයත් වන්නේ නාම ගණයට නොවැටෙන පඨවි, ආපෝ, තේජෝ, වායෝ යන සතර මහා භූතයන් සහ ඒවා ඇසුරු කොට පවත්නා පදාර්ථ වූ උපාදාය රූපයන් ය. ශීත, උෂ්ණ ආදී හේතූන් නිසා වෙනස් තත්ත්වයන්ට විනාශයට පත්වන හෙයින් ''රූප'' යනුවෙන් හැඳින්වේ. මෙහිදී අතීත, අනාගත, පච්චුප්පන්න යන කාල තුනට අයත් වූ හෝ ආධ්‍යාත්මික වූ හෝ බාහිර වූ හෝ රළු වූ සියුම් වූ හෝ හීන හෝ ප්‍රණීත වූ හෝ දුර වූ හෝ සමීප වූ හෝ රූප සියල්ල එක්කොට රූපක්ඛන්ධ යැයි කියනු ලැබේ.[9] මෙහිදී අභ්‍යන්තර රූප වශයෙන් විස්තර වන්නේ තම ශරීරය හා සම්බන්ධ වූ රූපයි.

ශරීරයට අසම්බන්ධ සියලුම රූප බාහිර රූප වශයෙන් දැක්වේ. තව ද පංචේන්ද්‍රියන්ට ගෝචර වන රූප ඕලාරික රූප වශයෙනුත්, ඉන්ද්‍රිය ගෝචර නොවන සියුම් රූප සුඛුම රූප වශයෙනුත් බෙදා විග්‍රහ වේ. මෙම බෙදීමට අමතරව අපේ ශරීරය විග්‍රහ කොට බැලීමේදී රූප (28) විසි අටකට ප්‍රභේද කොට විස්තර කරන අවස්ථා ද ධර්මයෙහි දක්නට ලැබේ. ඒ සඳහා භූත රූප හතරක් (04) හා උපාදාය රූප (24) විසි හතරක් වශයෙනි. (භූත රූප 04 හා උපාදාය රූප 24 දැක්විය යුතු ය.)

විඳීම් ස්වභාවය ලක්ෂණය කොට ඇති මානසික අවස්ථා සියල්ල වේදනාක්ඛන්ධයට ඇතුළත් වෙයි. ''යංකිඤ්චි වෙදයිත ලක්ඛණං සම්බන්තං එකතො කත්වා වේදනාක්ඛන්ධො වෙදිතබ්බො''[10] යි යනුවෙන් විස්තර වන්නේ යම් කිසි විඳීම් ලක්ෂණයක් වේ නම් ඒ සියල්ල එක්කොට සැලකීමෙන් වේදනාක්ඛන්ධ දත යුතු බවයි. සුඛ, දුක්ඛ, සෝමනස්ස, දෝමනස්ස, උපෙක්ඛා ආදී වශයෙන් වේදනාව පස් වැදෑරුම් වේ. එහිදී කුසල, විපාක, කාය, විඤ්ඤාණ, සම්ප්‍රයුක්ත වූයේ දුක්ඛ වේදනා ය. ඉහත දැක්වූ සියලුම පස්වැදෑරුම් වේදනාවන් ඉන්ද්‍රියයන් බාහිර ලෝකය සමඟ ස්පර්ශයට පැමිණීමෙන් සිදු වේ.

යම් දෙයක් හඳුනාගැනීම සඤ්ඤා නම් වේ. එනම්, දෙයක් හඳුනාගැනීම යි. හැඳිනීම් සමූහය සඤ්ඤාක්ඛන්ධය නම් වේ. සංඥාව ද ඇස, කන ආදී ඉන්ද්‍රියයන් අනුව ගෝචර වන රූප, ශබ්ද ආදී අරමුණු අනුව සවැදෑරුම් වෙයි. ඇස, රූපය සමඟ ගැටීමෙන් මේ අසවල් රූපය යි හැඳිනීම ඇති වේ. කන, ශබ්දය සමඟ ස්පර්ශ වීමෙන් මේ අසවල් ශබ්දය යැයි ශබ්දය හැඳිනීම ඇති වෙයි. නාසය ගඳ සුවඳ සමඟ ස්පර්ශ වීමෙන් මේ අසවල් ශබ්දය යැයි ශබ්දය හැඳිනීම ඇති වෙයි. නාසය ගඳ සුවඳ සමඟ ස්පර්ශ වීමෙන් ගඳ සුවඳ පිළිබඳ හැඳිනීම ඇති වේ. මේ ආදී වශයෙන් අනෙකුත් ඉන්ද්‍රියන් ඒ ඒ අරමුණු සම්බන්ධයෙන් ඇතිකර ගන්නා හැඳිනීම මෙහිදී සඤ්ඤාව නම් වේ.



සංඛාර යන්න බුදුසමයේ අර්ථ කිහිපයකින් විස්තර වේ. අනිච්චාවත සංඛාරා යන්නෙහි සංඛාර යනු ප්‍රත්‍යයන්ගෙන් හටගත් ධර්මය යි. විභඞ්ග පාළියෙහි දක්වන අන්දමට සංඛාර යන්න තුන් වැදෑරුම් වේ. පුඤ්ඤාභි සංඛාර, අපුඤ්ඤාභි සංඛාර හා අනෙඤ්ජාභි සංඛාර යනුවෙනි. කාය සංඛාර, වචී සංඛාර, මනො සංඛාර යයි තවත් ක්‍රමයකින් තුන් වැදෑරුම් ය. මේ සියලු සංස්කාරයෝ අවිද්‍යාව ප්‍රත්‍ය වීමෙන් පහළ වෙති. අවිජ්ජා පච්චයා සංඛාරා යන තන්හි සංඛාර ශබ්දයෙන් අදහස් වන්නේ එකී අදහසම යි. මෙහි පංචස්කන්ධයෙහිලා සංඛාරක්ඛන්ධය යන තන්හි සංඛාර නාමයෙන් ගැනෙන්නේ වේදනා, සංඥා යන චෛතසික දෙක හැර ඉතිරි වූ චෛතසික පනස ය. මෙහිදී සිත තුළ ඇති වන චෛතසික ධර්මයන්ගේ අභිසංස්කරණය හෙවත් විවිධ පෙළ ගැස්වීම් සංඛාර යනුවෙන් ගැනේ.

විඤ්ඤාණ යනු විජානනය යි. එනම්, දැනගැනීම යි. වෙනත් අයුරකින් පැහැදිලි කළහොත් රූප, ශබ්ද, ගන්ධ ආදී වශයෙන් අරමුණක් ඇති බව දැන ගැනීම විඤ්ඤාණය යි. එහෙත් අරමුණ කිනම් අරමුණක් දැයි හඳුනා ගැනීම විඤ්ඤාණයෙන් නො කෙරෙයි. එය සිදුවනුයේ සඤ්ඤාවෙනි. උදා :- ඇස රතුපාට සමඟ ගැටේ. මෙහිදී පහළ වන විඤ්ඤානය එය පාටක් බව දැන ගනී. නමුත්, නිල්පාට ලෙස හඳුනා ගන්නේ සඤ්ඤාවෙනි. විඤ්ඤාණය ද වේදනා, සඤ්ඤා දෙක මෙන් සයවැදෑරුම් වේ. ඇස ආශ්‍රය කොට රූපය අරමුණු කොට චක්ඛු විඤ්ඤාණයපහළ වේ. මෙහිදී චක්ඛු විඤ්ඤාණය යනු ඇසෙහි උපදින සිත හෝ ඇස ඇසුරින් ලබන දැනුම යි.

මේ ආදී වශයෙන් අනෙකුත් ඉන්ද්‍රියන් මූලික කරගනිමින් විඤ්ඤාණය පහළ වේ. සංයුක්ත නිකායේ ඛන්ධසංයුත්තයේ දී මෙම සියලු ස්කන්ධයන්ගේ අනිත්‍ය ස්වභාවය පැහැදිලි කරයි. එහිදී රූපය පෙණ පිඬක් මෙනි. වේදනාව දිය බුබුලකට සමාන ය. සඤ්ඤා මිරිඟුවක් හා සමාන ය. සංඛාර කෙසෙල් ගස් මෙන් හරයෙන් තොර ය. විඤ්ඤාණය මායාවක් වැනි ය.[11]

භාරතීය ඇතැම් ආගමික ඉගැන්වීම් තුළ මෙම ස්කන්ධවලට අයත් කොටස් ආත්ම වශයෙන් සලකා තිබුණි. විඤ්ඤාණය

ආත්මයේ හරය ලෙස ජෛන ආගමේ සඳහන් වේ.[12] ඇතැම් පරිබ්‍රාජක පිරිස් සඤ්ඤාව පුරුෂයාගේ ආත්මය ලෙස සලකා ඇත. සාති නම් භික්ෂුවක් විඤ්ඤාණය ආත්මයක් ලෙස භවයෙන් භවයට සැරිසරන බව ප්‍රකාශ කළේ ය.[13]

උදාන පාලියේ මෙඝිය සූත්‍රයේ විස්තර කෙරෙනුයේ අනාත්මවාදය හටගන්නේ අනිත්‍යතාවාදය උඩ බවයි. අනිත්‍යතාවාදයෙන් බැහැර අනාත්මවාදයක් නැත. බුදුන් වහන්සේ අනත්ත ලක්ඛන සූත්‍රයේ සහ ආදිත්ත පරියාය සූත්‍රයේ දී පළමුව ස්කන්ධයන්ගේ අන්ත්‍යතාව විග්‍රහ කළේ මේ නිසා ය.

''සබ්බං භික්ඛවේ ආදිත්තං, කිඤ්ච භික්ඛවේ සබ්බං ආදිත්තං, චක්ඛු-පෙ-රූපං චක්ඛු විඤ්ඤාණං-පෙ-චක්ඛු සම්ඵස්සො යම්පිදං චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති, වෙදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි ආදිත්තං''

අනිත්‍යවාදය සිද්ධාන්තයක් බවට පත්කිරීමට බුදුන් වහන්සේ දේශනා කළ මේ ආදිත්ත පරියාය සූත්‍රය නිසා අනිත්‍යවාදය විග්‍රහ වෙනවා මෙන්ම එමගින් අනාත්මවාදය ද ගොඩ නැගුණේ ය.

ආත්ම සංකල්පය ප්‍රතික්ෂේප කරන බුදුසමය පුද්ගලයා යන්න ස්කන්ධ වශයෙන් පමණක් නොව ආයතන වශයෙන් ද පැහැදිලි කරයි. කෙටියෙන් කියතොත් මෙහිදී ආයතන නමින් හඳුන්වන්නේ පුද්ගලයා, බාහිර ලෝකය හා සම්බන්ධ කරන චක්ඛු, සෝත, ඝාණ, ජිව්හා, කාය, මන ආදී ආයතන සය හා එමගින් බාහිර ලෝකයෙන් ගන්නා රූප, ශබ්ද, ගන්ධ, රස, ඵොට්ඨබ්බ හා ධම්ම යන අරමුණු හය යි. මෙහිදී චක්ඛු ආදී ආයතන ආධ්‍යාත්මික ආයතන වශයෙනුත්, රූපාදී ආයතන බාහිර ආයතන වශයෙනුත් පිළිගැනේ. සූත්‍රවල දී ආධ්‍යාත්මික ආයතන ඉන්ද්‍රිය ආයතන වශයෙනුත්, බාහිර ආයතන ආරම්මණ ආයතන වශයෙනුත් විස්තර කෙරේ.[14] පුද්ගලයා යනුවෙන් අප ව්‍යවහාර කරන්නේ චක්ඛු, සෝත ආදී ඉන්ද්‍රිය හයට ය. බාහිර ලෝකය යනු අපගේ එම ඉන්ද්‍රියවලට විෂය වන අරමුණුයි. එයින් පරිබාහිර වූ ලෝකයක් පිළිබඳව බුදුසමයේ කරුණු සාකච්ඡා නොකරයි. පුද්ගලයා හා ඔහුට සාපේක්ෂක ලෝකය විශ්ලේෂණය



කොට ඇති ආයතන දොළසම අන්ත්‍ය බව සබ්බ සූත්‍රයේ දී පැහැදිලි කරයි[15] සතිපට්ඨාන සූත්‍රයේ දී ද මෙම ආයතන ධර්ම දෙස සිහියෙන් යුතුව බැලීමෙන් ඒවායෙහි ක්‍රියාකාරීත්වය මැනවින් වටහාගත හැකි වේ. එසේ සිහි නුවණින් විමසන විට පැහැදිලි වන්නේ එහි ඇත්තේ හුදු ආයතනික ක්‍රියාවලියක් මිස ආත්ම වැනි කල්පිත බලවේගයක් නොවන බව යි.

ආයතන ධාතු තවදුරටත් බෙදා විශ්ලේෂණය කිරීමක් ධාතු විභාගයේ දී සිදු වී තිබේ. මෙහි දී ධාතු කොටස් (18) දහ අටකට බෙදා දක්වයි. කලින් සඳහන් වූ ආයතනවලින් ඉන්ද්‍රිය හා ආරම්මණය පමණක් විස්තර වුව ද ධාතු විභාගයේ දී ඉන්ද්‍රිය විඤ්ඤාණය ද ඇතුළත් කොට ඇත.

| | | |
|---|---|---|
| චක්ඛු ධාතු | රූප ධාතු | චක්ඛු විඤ්ඤාණ ධාතු |
| සෝත ධාතු | සද්ද ධාතු | සෝත විඤ්ඤාණ ධාතු |
| ඝාණ ධාතු | ගන්ධ ධාතු | ඝාණ විඤ්ඤාණ ධාතු |
| ජිව්හා ධාතු | රස ධාතු | ජිව්හා විඤ්ඤාණ ධාතු |
| කාය ධාතු | ඵොට්ඨබ්බ ධාතු | කාය විඤ්ඤාණ ධාතු |
| මනො ධාතු | ධම්ම ධාතු | මනො විඤ්ඤාණ ධාතු |

මෙම ධාතු විග්‍රහයේ දී ඉන්ද්‍රිය, ආරම්මණ හා ඉන්ද්‍රිය විඤ්ඤාණ යන අංශ තුන ඇතුළත් වේ. මෙසේ පුද්ගලයා ධාතු වශයෙන් ද බෙදා දැක්වීමෙන් පැහැදිලි වන්නේ නිත්‍ය වූ ආත්මයක් පිළිබඳ සංකල්පනාවන්ගේ අනිත්‍යත්වය තවදුරටත් අවධාරණය කිරීමට ඒ ඒ කොටස් රාශියක බෙදා විශ්ලේෂණය කිරීම යි.

මේ ආදී වශයෙන් පුද්ගලයා හා ඔහුට සාපේක්ෂක ලෝකය ස්කන්ධ, ආයතන, ධාතු ආදී වශයෙන් විග්‍රහ කරනු ලබනුයේ විශ්වය තුළ හෝ ඉන් පරිබාහිරව නිත්‍ය වූ කිසිවක් නොමැත යන්න පැහැදිලි කිරීම ය. ආත්මය සත්‍ය වශයෙන් පිළිගන්නට සත්වයා උත්සහ ගනුයේ මමත්වය නිසා ය. එහි ඉන්ද්‍රියන් උපයෝගී කරගනිමින් බාහිර අරමුණු ගැනීමේ දී ඒවා මට ය, මාගේ ය යනුවෙන් උපාදානය කිරීම නිසාවෙනි. අනන්ත

ලක්ඛණ සූත්‍රයේ දී මේ පිළිබඳව ඉතා දීර්ඝ විස්තරයක් දක්නට ලැබේ.

මහණෙනි, රූපය අනාත්ම වේ. ඉඳින් එය ආත්ම වී නම් රූපය ආබාධ පිණිස නොපවතින්නේ ය. මේ මාගේ රූපය මෙසේ වේවා, මෙසේ නොවේවා යැයි සිතූ පරිදි පවත්වාගත නොහැකි ය. මහණෙනි, එසේ හෙයින් රූපය අනාත්ම වේ. එය ආබාධ පිණිස පවතින්නේ වෙයි. තමාට මනාප පරිද්දෙන් පවත්වාගත හැකි තත්ත්වයක් ද නැත. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ සම්බන්ධ තත්ත්වය ද මෙබඳු ම ය. අනතුරුව බුදුන් වහන්සේ රූපය නිත්‍ය ද අනිත්‍ය දැයි භික්ෂූන්ගෙන් විමසූහ. භික්ෂූන් එය අනිත්‍ය යයි පිළිතුරු දුන්හ. යමක් අනිත්‍ය නම් එය දුක ද සැප දැයි බුදුන් වහන්සේ ඇසූ පැනයට භික්ෂූහු දුක යයි උත්තර දුන්හ. මහණෙනි, අනිත්‍ය ද දුක ද පෙරළෙන ස්වභාවය ඇත්තේ ද එය මගේ ය. එය මම වෙමි. එය මගේ ආත්මය වේ යනුවෙන් ගැනීම සුදුසු වේ ද? නැත යනු භික්ෂූන්ගේ පිළිතුරු විය. වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන කරුණු සම්බන්ධයෙන් ද මේ ප්‍රශ්නෝත්තර මෙසේ වීය. ඉන්පසු බුදුන් වහන්සේ මෙසේ දෙසති. මහණෙනි, එහෙයින් මේ ලෝකයෙහි ආධ්‍යාත්මික වූ හෝ බැහැර වූ හෝ මහත් වූ හෝ සියුම් වූ හෝ හීන වූ හෝ ප්‍රණීත වූ හෝ අතීත, අනාගත, වර්තමාන යන තුන් කාලයට අයත් වූ හෝ යම්කිසි රූපයක් වේ ද, යමක් ඇත හෝ නැත හෝ වේ ද, ඒ සියලු රූපය මාගේ නොවේ. මම නොවෙමි. මාගේ ආත්මය නෙවේ. මෙසේ මෙය තත් වූ පරිදි මාන නුවණින් දත යුතු වේ. වේදනා, සඤ්ඤා, සංඛාරා, විඤ්ඤාණ යන මේවා ද මාගේ නොවේ, මම නොවෙමි, මාගේ ආත්මය නොවේ. මෙය ද මෙසේ තත් වූ පරිදි මනා නුවණින් දත යුතු වේ. මෙසේ දන්නා ආර්ය ශ්‍රාවකයා රූපයෙහි ද, වේදනාවෙහි ද, සඤ්ඤාවෙහි ද, සංඛාරයන්හී ද, විඤ්ඤාණයන්හී ද කලකිරේ. කලකිරුණෝ නොඇලේ. ආත්ම යැයි කිසිවක් නොගනී.[16]



## නිගමනය

ක්‍රි.පූ. හයවන සියවස් භාරතීය සමාජ පසුබිම වූ කලී විවිධ වූ ආගමික, දාර්ශනික අදහස්වලින් යුක්ත වූ බව බෞද්ධ සූත්‍ර ධර්ම විමසීමෙන් ම පැහැදිලි වේ. ඇතැම් ආගමික සම්ප්‍රදායයන් පංචස්කන්ධයේ ක්‍රියාකාරීත්වය ආත්මය මුල්කොට ගෙන සිදුවන්නක් ලෙස සිතූ අයුරු චූලපච්චක, අනත්ත ලක්ඛණ වැනි සූත්‍රවලින් ප්‍රකට වෙයි. මෙහි දක්වන ලද ඛන්ධ, ආයතන, ධාතු විභාගයෙන් ද පැහැදිලි වන්නේ ආත්ම යැයි යමක් සම්මුති වශයෙන් සඳහන් කළ ද පරමාර්ථ වශයෙන් එසේ නොපවතින බවයි. බුදුදහම අනාත්ම සිද්ධාන්තය ගොඩනගන්නේ ආත්ම සිද්ධාන්තය විග්‍රහ කිරීමෙනි.

මනුෂ්‍යයාගේ විමුක්තියට ප්‍රබල බාධකය නම් නැති ආත්මය ඇති සේ ගැනීම බව බුද්ධ දේශනාවලින් පැහැදිලි ය.මජ්ඣිම නිකායේ අලගද්දූපම සූත්‍රයේ දී ලෝකය ආත්මය වශයෙන් ගැනීම සම්පූර්ණ බාල ධර්මයක් වශයෙන් දක්වා ඇත. ආත්මයක් තිබී එය මරණයෙන් විනාශ වේ යයි පැවසීම උච්ඡේදවාදය යි. ශාශ්වත වාදයේ දී ආත්මය මරණින් මතු ද නිත්‍ය වශයෙන් පවතී. මේ අන්ත දෙකම බුදුදහම පිළිනොගනී. අනාත්ම දර්ශනය බුදුදහමේ ගැඹුරු ම ඉගැන්වීමකි. නිවන් දැකීම යනු ද මේ සත්‍ය වටහා ගැනීම ය. මෙම සත්‍ය වටහා ගැනීමෙන් නාම රූප ධර්ම කෙරෙහි නො ඇලෙයි. ඒ පිළිබඳව පැවති තෘෂ්ණාව දුරු වෙයි. තෘෂ්ණාව මුළුමනින් ම දුරු වූ කල්හි මතු භවයන්හි නාම රූප ධර්මයන් හට නොගනී. මෙසේ වීමෙන් දුකින් මිදීම සිදු වෙයි.

## ආන්තික සටහන්


1. ගල්මංගොඩසුමනපාල, 1994, *බෞද්ධ දර්ශනය මූලධර්ම විග්‍රහයක්*, පි 31, අභයමුද්‍රණාලය, කැළණිය.

2' Majjima Nikaya 1, Dighanaka Sutta, Translated by Bhikku Thannissaro, p.497, Plai Text Society, London.

3. Majjima Nikaya 3, Chachakka Sutta, Translated by Bhikku Thannissaro, P. 280, Pali Text Society, London.

4. සංයුක්ත නිකාය iii, අනන්ත සුත්ත, පි. 39, බු. ජ. ත්‍රි., ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, තායිවානය.

5. මජ්ඣිමනිකාය i, අලගද්දූපමසුත්ත, පි. 326, බු. ජ. ත්‍රි., ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, තායිවානය.

6. සංයුක්ත නිකාය iii, අවිජ්ජාසුත්ත, පි. 285, බු. ජ. ත්‍රි., ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, තායිවානය.

7. Sanyutta Nikaya 1, Vajira Sutta,Translated by Bhikku Bodhi, P. 134, Pali Text Society, London.

8. විසුද්ධිමග්ගය, පි. 578, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

9. එම.

10. විසුද්ධිමග්ගය, පි. 617, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, නැදිමාල, දෙහිවල.

11. සංයුක්ත නිකාය, ඛන්ධ සංයුක්තය, පි. 380, බු. ජ. ත්‍රි., ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, තායිවානය.

12. A Critical Survey of Indian Philosophy, P,19

13. මජ්ඣිමනිකාය i,මහාතණ්හාසංඛයසුත්ත, පි. 602, බු. ජ. ත්‍රි., ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, තායිවානය.

14. සංයුත්ත නිකාය, සළායතනසංයුක්තය, සබ්බසුත්ත,පි. 25, බු. ජ. ත්‍රි., ශ්‍රී ලංකා ධර්මචක්‍ර පදනම, තායිවානය.

15. -එම, පි. 51

16. අබේනායක ඔලිවර්, 2009, *බෞද්ධඅධ්‍යයන විමර්ශන*, සංස්. මහමිතව පඤ්ඤාරතනහිමිසහ පහළගම ධම්මික හිමි, මාගධී බෞද්ධ අධ්‍යාපන ආයතනය, මිරිස්වත්ත.